# ධර්මසේන පතිරාජගේ සිනමා නිර්මාණවල නිරූපිත දේශපාලනික සහ සමාජීය යථාර්ථය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී. ඒ. නිපුණ හේමින්ද බස්නායක[1]

ලාංකේය සිනමා වංශයෙහි ධර්මසේන පතිරාජට හිමිවන්නේ වෙසෙස් තැනකි. එයට හේතුව ඔහු සිය සිනමා කෘතිවලට විෂය කරගන්නා ක්ෂේත්‍රයෙහි පවත්නා සුවිශේෂත්වය යි. සෙසු නිර්මාණකරුවන් හා සසඳාබැලීමේ දී පතිරාජ තම චිත්‍රපටයෙහි අළෙවිය පිළිබඳ උනන්දු නො වුණු අතර නිරන්තරයෙන් තමා ලත් ජීවන අද්දැකීම් ස්වකීය චිත්‍රපටවල නිරූපණය කිරීමට ප්‍රයත්න දැරී ය. නිර්මාණකරුවකුට තමා ජීවත් වන පරිසරයෙන් වියුක්ත ව නිර්මාණකරණයෙහි යෙදීමේ ශක්‍යතාවක් නොමැත. ඒ අනුව ධර්මසේන පතිරාජගේ සිනමා නිර්මාණයන්හි කෙබඳු දේශපාලනික සහ සමාජීය යථාර්ථයක් නිරූපණය වේ ද යන්න පිළිබඳ විමර්ශනයක් මෙමඟින් සිදු කර ඇත. පතිරාජගේ සිනමා නිර්මාණ කෙරෙහි බොහොමයක් විචාරකයන් අවධානය යොමු කර ඇත. ඒ සමස්තයක් වශයෙන් සැලකීමෙනි. පතිරාජගේ සිනමා නිර්මාණයන්හි නිරූපිත දේශපාලනික සහ සමාජීය යථාර්ථය පිළිබඳ කෙරෙන සාකච්ඡා අල්ප බව පෙනේ. එහෙත් ධර්මසේන පතිරාජගේ චිත්‍රපටවල තත්කාලීන දේශපාලනික සහ සමාජීය යථාර්ථය ඍජු ව හෝ වක්‍රාකාරයෙන් නිරූපණය වී නොමැති යැ යි සිතීම ගැටලු සහගත ය. මේ අධ්‍යයනයේ දී ද්විතීයික මූලාශ්‍රය බවට පත්වූයේ ධර්මසේන පතිරාජගේ සිනමා නිර්මාණ සහ තත්කාලීන දේශපාලනික සහ සමාජීය තත්ත්වය සඳහන් කෘති ය. ඊට අමතර ව ධර්මසේන පතිරාජ සමඟ විචාරකයන් කළ සම්මුඛ සාකච්ඡා ඇතුළත් වාර සඟරා හා පැරණි පුවත්පත් ද ඔහුගේ සිනමා නිර්මාණ කෙරෙහි අවධානය යොමු කළ කෘති ද පාදක විය. සිනමාව පිළිබඳ උනන්දුවක් දක්වන වියත් විචාරකයන් සමඟ කළ සාකච්ඡා ද පර්යේෂණ ක්‍රියාවලියේ දී බෙහෙවින් ඉවහල් විය. ඒ අනුව ධර්මසේන පතිරාජගේ සිනමා නිර්මාණයන්හි තත්කාලීන දේශපාලනික සහ සමාජ යථාර්ථය තීව්‍ර ලෙස නිරූපණය වන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** ධර්මසේන පතිරාජ, ලාංකේය සිනමාව, සමාජ යථාර්ථය, තත්කාලීන දේශපාලනික යථාර්ථය

---

[1] සිංහල අධ්‍යනාංශය